සියලුම හිමිකම් ඇවිරිණි.
All Rights Reserved

## වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

## දෙවන වාර පරීක්ෂණය 2018

**10 ශ්‍රේණිය** **ව්‍යවසායකත්ව අධ්‍යයනය - I** **කාලය පැය 01 යි.**

නම/ විභාග අංකයඃ

i. ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න. මෙම පත්‍රය සඳහා ලකුණු 40 ක් හිමි වේ.
ii. 1 සිට 40 තෙක් ප්‍රශ්නවල දී ඇති 1, 2, 3, 4 පිළිතුරුවලින් නිවැරදි හෝ වඩාත් ගැලපෙන හෝ පිළිතුර තෝරන්න.
iii. ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ ඔබ තෝරාගත් පිළිතුරෙහි අංකයට ගැලපෙන කවය තුළ (×) ලකුණ යොදන්න.

01. ව්‍යවසායකත්ව සංකල්පය වඩාත් නිවැරදිව විස්තර වන්නේ,
(1) අලුත් අදහස් හා සංකල්ප ක්‍රියාවට නැංවීමට උත්සාහ ගැනීම.
(2) පවතින දේ වෙනස් කරමින් නවතම භාණ්ඩයක් හෝ සේවාවක් නිපදවීම.
(3) සාර්ථක ව්‍යාපාරයකට සවිමත් අඩිතාලමක් දැමීම.
(4) පරිසර අවස්ථා හඳුනා ගනිමින් අවදානම් දරමින් නව්‍යතා බිහි කිරීම.

02. සෙසු නිෂ්පාදන සාධක සමග සැසඳීමේදී ව්‍යවසායකත්වයේ සුවිශේෂත්වය වන්නේ,
(1) අදහස් ක්‍රියාවට පරිවර්තනය කිරීමට ව්‍යවසායකයාට හැකි වීමයි.
(2) ව්‍යවසායකයා භාණ්ඩ හා සේවා නිපදවීමයි.
(3) ව්‍යවසායකයා අවදානම් දරමින් නව්‍යතා බිහි කිරීමයි.
(4) නිෂ්පාදන සාධක සංයෝග කරමින් භාණ්ඩ හා සේවා නිපදවීමට ව්‍යවසායකත්වය අවශ්‍ය වීමයි.

03. භූමිය, ශ්‍රමය, ප්‍රාග්ධනය යන නිෂ්පාදන සාධක සඳහා නිදසුනක් පිළිවෙලින් සඳහන් වන්නේ,
(1) අමුද්‍රව්‍ය, ඉංජිනේරු ශ්‍රමය, ප්‍රාග්ධනය. (2) ඉඩම්, ගොඩනැගිලි, වඩු කාර්මික ශ්‍රමය.
(3) ගොඩනැගිලි, වනාන්තර, ගුරුවරයාගේ ශ්‍රමය. (4) පස, යන්ත්‍ර, වඩු කාර්මික ශ්‍රමය.

04. පුද්ගලයින් තිදෙනෙකුගේ ව්‍යාපාරික හැසිරීම් පහත පරිදි වේ.
සමීර - ලාභ උපරිම කිරීම අපේක්ෂා කරයි.
චමීර - නිවැරදි දැක්මක් සහිතව නව නිර්මාණ සිදු කරමින් ව්‍යාපාර සාර්ථකත්වය කරා මෙහෙයවයි.
සුමීර - සම්පත් ප්‍රශස්ත ලෙස යොදා ගනිමින් ව්‍යාපාර කටයුතු මෙහෙයවයි.
ව්‍යවසායකත්වය විස්තර කිරීමට වඩාත් උචිත චරිතය වන්නේ
(1) සමීරය. (2) චමීරය. (3) සුමීරය. (4) තිදෙනාමය.

05. ව්‍යවසායකත්ව ගති ලක්ෂණයක් නොවන්නේ
(1) සුභවාදී වීම. (2) අනාගත දැක්ම.
(3) සන්නිවේදන කුසලතා. (4) ස්වාධීනත්වය.

06. නවෝත්පාදන සඳහා පදනම් වන මූලාශ්‍රයක් වන්නේ,
(1) සංකලනයක්. (2) දිගුවක්.
(3) අනපේක්ෂිත සිදුවීමක්. (4) අනුකරණයක්.

07. භාණ්ඩවල ඇති සුවිශේෂී ලක්ෂණයකි,
(1) සපයන්නාගෙන් වෙන් කළ නොහැකි වීම.
(2) ගබඩාකළ නොහැකි වීම.
(3) නිෂ්පාදන ක්‍රියාවලිය පාරිභෝගිකයාට අත්‍යාවශ්‍ය වීම.
(4) සමජාතීය බව ආරක්ෂා කළ හැකි වීම.

08. ආයතනයක ඉහළ තනතුරු දරණ එමෙන්ම ව්‍යවසායකත්ව ගුණාංග ඇති පුද්ගලයෝ,

(1) සුහසාධක ව්‍යවසායකයෝ වේ. (2) ආයතනික ව්‍යවසායකයෝ වේ.

(3) ව්‍යාපාර ව්‍යවසායකයෝ වේ. (4) සමාජීය ව්‍යවසායකයෝ වේ.

09. මිනිස් අවශ්‍යතා හා වුවමනාවල ලක්ෂණ පිළිවෙලින් දක්වා ඇති පිළිතුර තෝරන්න.

(1) අසීමිතයි, මූලිකව පැනනගී. (2) විවිධයි, සියලු දෙනාට පොදුයි.

(3) සීමිතයි, විවිධයි. (4) පොදුයි, සීමිතයි.

10. ව්‍යාපාර ගති ලක්ෂණයක් නොවන්නේ,

(1) අරමුණක් පැවතීම. (2) ආර්ථික කටයුත්තක යෙදීම.

(3) අවදානමක් නොපැවතීම. (4) ගණුදෙනු අඛණ්ඩව සිදුවීම.

11. ව්‍යවසායකත්ව ප්‍රතිලාභ අතර ව්‍යවසායකයාට හිමිවන ප්‍රතිලාභයයක් නොවන්නේ,

(1) ආකර්ෂණීය ලාභයක් ඉපයීම. (2) කාර්යයන්හි විවිධත්වයක් ඇතිවීම.

(3) රැකියා අවස්ථා ජනනය කිරීම. (4) නිදහස හා ඉතා ඉහළ තෘප්තිය.

12. පාසල් බෑග්, කමිස, බෙහෙත් වර්ග යනාදිය මගින් ඉටුකරන අවශ්‍යතා පිළිවෙළින් දක්වා ඇත්තේ.

(1) අධ්‍යාපනය, ඇඳුම්, සෞඛ්‍යය. (2) ඇඳුම්, අධ්‍යාපනය, සෞඛ්‍යය.

(3) ආහාර, ඇඳුම්, සෞඛ්‍ය. (4) සෞඛ්‍ය, අධ්‍යාපනය, ඇඳුම්.

13. සමන් ඔහුගේ ව්‍යාපාරයෙන් මසකට රු. 20,000 ක ලාභයක් අපේක්ෂා කරයි. මෙමගින් පිළිබිඹු වන ව්‍යාපාර ගති ලක්ෂණය වන්නේ,

(1) ආර්ථික කටයුත්තක් වීම. (2) අරමුණක් පැවතීම.

(3) අවදානමක් පැවතීම. (4) ගනුදෙනු අඛණ්ඩව සිදුවීම.

14. පවතින භාණ්ඩයක හෝ සේවාවක හෝ ක්‍රියාවලියක හෝ නව භාවිතයක් ඇති කිරීම.

(1) දිගුවකි. (2) නව සොයා ගැනීමකි.

(3) අනුකරණයකි. (4) සංකලනයකි.

15. නවෝත්පාදන සිදුවන ආකාරයක් හා නවෝත්පාදන සඳහා පදනම්වන මුලාශ්‍රයක් පිළිවෙලින් දැක්වෙන පිළිතුර වන්නේ,

(1) නව සොයා ගැනීමක්, දිගුවක්. (2) අනපේක්ෂිත සිදුවීමක්, සංකලනයක්.

(3) දිගුවක්, ක්‍රියාවලි අවශ්‍යතා. (4) ක්‍රියාවලි අවශ්‍යතා, දිගුවක්.

16. ව්‍යවසායකයෙකු මුහුණ දෙන අවදානම හා ප්‍රතිලාභය අතර ඇති සම්බන්ධතාවය වන්නේ.

(1) අවදානම අඩු නම් ප්‍රතිලාභය අඩු වේ.

(2) අවදානම අඩු වන විට ප්‍රතිලාභය වැඩි වේ.

(3) අවදානම වැඩි වන විට ප්‍රතිලාභය අඩු වේ.

(4) අවදානම හා ප්‍රතිලාභය අතර සම්බන්ධයක් නැත.

17. මිනිස් අවශ්‍යතා සපුරා ගන්නා විවිධ ස්වරූප,

(1) වුවමනා වේ. (2) අවශ්‍යතා වේ. (3) නිෂ්පාදිත වේ. (4) භාණ්ඩ වේ.

18. සිල්ලර වෙළෙන්දා උදාහරණයක් වන්නේ,

(1) අභ්‍යන්තර ව්‍යවසායකයාටයි. (2) ව්‍යාපාර ව්‍යවසායකයාටයි.

(3) සමාජ ව්‍යවසායකයාටයි. (4) ආයතනික ව්‍යවසායකයාටයි.

19. තමාගේ ගමන් මග මෙන්ම ගමනාන්තය තමා විසින්ම තීරණය කිරීම හා පාලනය කිරීමට ඇති හැකියාව,

(1) ස්වයං පෙළඹවීමයි. (2) ආත්ම විශ්වාසයයි.

(3) ස්වාධීනත්වයයි. (4) අනාගත දැක්මයි.

20. ව්‍යවසායකයෙක් නායකත්ව භූමිකාවේ කටයුතු කිරීමේදී ඉටු කිරීමට සිදුවන කාර්යයකි,

(1) ව්‍යාපාර සැලසුම් සැකසීම. (2) ලාභ පාඩු විඳදරා ගැනීම.

(3) අවදානම් දැරීම . (4) සේවකයන් පෙළඹවීම.

21. ව්‍යවසායකත්ව භූමිකා ගණන,

(1) 2 කි. (2) 3 කි. (3) 4 කි. (4) 5 කි.

22. සේවකයින්ගේ පෞද්ගලික ප්‍රශ්න හා සේවකයන් අතර ඇතිවන ගැටළු විසඳීමට ඇති හැකියාව,

(1) සංකල්පනාත්මක කුසලතාවයි. (2) සන්නිවේදන කුසලතාවයි.

(3) උපදේශන කුසලතාවයි. (4) තාක්ෂණික කුසලතාවයි.

23. ව්‍යවසායකයෙකු සතු සන්නිවේදන කුසලතාවට අයත් නොවන්නේ ,

(1) සාධාරණව කටයුතු කිරීම. (2) රැස්වීම් පැවැත්වීම.

(3) පණිවිඩ බෙදා හැරීම. (4) වාර්තා හා තොරතුරු බෙදා හැරීම.

24. ව්‍යවසායකත්වයෙන් ලැබෙන ප්‍රතිලාභ පමණක් ඇතුළත් පිළිතුර වන්නේ,

(1) ව්‍යවසායකයාට හිමිවන ප්‍රතිලාභ, දේශීය ආර්ථිකයට හිමිවන ප්‍රතිලාභ.

(2) ව්‍යවසායකයාට හිමිවන ප්‍රතිලාභ, සමාජයට හිමිවන ප්‍රතිලාභ..

(3) සමාජයට හිමිවන ප්‍රතිලාභ, ආයතනයට හිමිවන ප්‍රතිලාභ

(4) ආර්ථිකයට හිමිවන ප්‍රතිලාභ, ප්‍රජාවට හිමිවන ප්‍රතිලාභ.

25. ''නිදහස තුළින් ඉතා ඉහළ තෘප්තියකට පත් වීම'' අයත් වන්නේ ව්‍යවසායකත්වයෙන් හිමිවන පහත සඳහන් කවර ප්‍රතිලාභයටද ?

(1) ව්‍යවසායකයාට හිමිවන ප්‍රතිලාභ. (2) දේශීය ආර්ථිකයට හිමිවන ප්‍රතිලාභ.

(3) සමාජයට හිමිවන ප්‍රතිලාභ. (4) ප්‍රජාවට හිමිවන ප්‍රතිලාභ.

26. පෞද්ගලික හිමිකාරීත්වය යටතේ ස්වාධීනව මෙහෙයවනු ලබන සාපේක්ෂව කුඩා සේවක සංඛ්‍යාවක් හා අඩු ආයෝජනයක් සහිත ව්‍යාපාර,

(1) මධ්‍ය පරිමාණ ව්‍යාපාර වේ. (2) මහා පරිමාණ ව්‍යාපාර වේ.

(3) කුඩා පරිමාණ ව්‍යාපාර වේ. (4) ක්ෂුද්‍ර පරිමාණ ව්‍යාපාර වේ.

27. පාරිභෝගික අවශ්‍යතා හා වුවමනා සපුරාලීමට නොහැකිවූ වෙළෙඳපොළ කොටස,

(1) වෙළෙඳපොළ අවකාශය වේ. (2) වෙළෙඳපොළ හිදැස වේ.

(3) වෙළෙඳපොළ ඉල්ලුම වේ. (4) වෙළෙඳපොළ අවස්ථාව වේ.

28. බොහෝ සාර්ථක ව්‍යවසායකයින්ගේ ආරම්භය,

(1) ක්ෂුද්‍ර පරිමාණ ව්‍යාපාර තුළින් බිහිවිය. (2) කුඩා පරිමාණ ව්‍යාපාර තුළින් බිහිවිය.

(3) මධ්‍ය පරිමාණ ව්‍යාපාර තුළින් බිහිවිය. (4) මහා පරිමාණ ව්‍යාපාර තුළින් බිහිවිය.

29. අවදානමට ප්‍රධානතම හේතුව වන්නේ,

(1) අවිනිශ්චිතතාවයයි. (2) නම්‍යශීලීත්වයයි.

(3) දැඩි ආශාවයි. (4) සාමාන්‍ය වැටහීමයි.

30. අසාර්ථකත්වය ව්‍යවසායකයින් සලකන්නේ අත්දැකීමක් ලෙසය, මේ සඳහා හොඳම උදාහරණය වන්නේ

(1) ජෙසිකා කොක්ය. (2) ජොන් ලොගී බෙයාර්ය.

(3) තෝමස් අල්වා එඩිසන්ය. (4) අයිසෙක් නිව්ටන්ය.

31. ව්‍යාපාර හිමිකරුවන් ලෙස සපයාගත් සම්පත් ව්‍යාපාරයේ අරමුණු ළඟා කර ගැනීම පිණිස නිසි ලෙස භාවිතා කිරීම හඳුන්වන්නේ

(1) කළමනාකරණ භූමිකාව ලෙසය. (2) අයිතිකරු භූමිකාව ලෙසය.

(3) නායකත්ව භූමිකාව ලෙසය. (4) ආයෝජන භූමිකාව ලෙසය.

32. ව්‍යාපාරවල ප්‍රමාණය අනුව ව්‍යාපාර ප්‍රධාන කොටස් කීයකට වර්ග කරයි ද? ,

(1) 2 යි. (2) 3 යි. (3) 4 යි. (4) 5 යි.

33. ව්‍යාපාරයක් ආරම්භ කර පවත්වාගෙන යාම පිණිස යොදා ගන්නා හා යොදා ගත හැකි සියලුම වාසිදායී සාධක හඳුන්වන්නේ,

(1) අවස්ථා ලෙස ය. (2) ශක්තීන් ලෙස ය. (3) සීමා ලෙස ය. (4) ප්‍රතිඵල ලෙස ය.

34. ව්‍යාපාරයක් ආරම්භ කොට පවත්වාගෙන යාමේදී එම ක්‍රියාකාරීත්වයට බාධා පමුණුවන සාධක හඳුන්වන්නේ,

(1) ශක්ති ලෙසය. (2) සීමා ලෙසය. (3) දුර්වලතා ලෙසය. (4) තර්ජන ලෙසය.

35. අභ්‍යන්තර පරිසර සාධක වලට අයත් නොවන්නේ

(1) අයිතිකරුවෝ. (2) කළමනාකරුවෝ.

(3) සම්පත්. (4) තාක්ෂණය.

36. අතීතයේ පැවති ව්‍යාපාර වලට වඩා වර්තමාන ව්‍යාපාර වල විශේෂ ලක්‍ෂණ දැකිය හැකිය. ඒ අනුව නූතන ව්‍යාපාරයක දැකිය හැකි එවැනි ලක්‍ෂණයක් වන්නේ,

(1) ලාභය ප්‍රධාන අරමුණ වීම. (2) තරගකාරීත්වය අඩු වීම.

(3) ගෝලීය වශයෙන් ව්‍යාප්ත වීම. (4) ව්‍යාපාරිකයෝ බලවත් වීම.

37. ව්‍යාපාර පරිසරය වර්ග කල හැකි ආකාර දෙක වන්නේ,

(1) අභ්‍යන්තර පරිසරය හා ආසන්න පරිසරය. (2) ආසන්න පරිසරය හා සාර්ව පරිසරය.

(3) ආසන්න පරිසරය හා බාහිර පරිසරය. (4) අභ්‍යන්තර පරිසරය හා බාහිර පරිසරය.

38. ව්‍යාපාරයට ප්‍රාග්ධනය සපයන පුද්ගලයන් හඳුන්වන්නේ,

(1) කළමනාකරුවන් ලෙසය. (2) අයිතිකරුවන් ලෙසය.

(3) සේවකයන් ලෙසය. (4) සැපයුම් කරුවන් ලෙසය.

39. ව්‍යාපාරය හොඳින් පවත්වාගෙන යාමට සුදුසු නම්‍යශීලී සැලැස්මක් ව්‍යාපාරය සතුව පැවතීම එම ව්‍යාපාර සතු.

(1) ශක්තියකි (2) දුර්වලතාවයකි (3) අවස්ථාවකි (4) තර්ජනයකි

40. ''රජය ඉන්දියාව සමග නව වෙළඳ ගිවිසුමක් අත්සන් කිරීමට සූදානම් වේ'' මෙම තීරණය තුළින් බලපෑමට ලක්වන පරිසර සාධකය වන්නේ

(1) ප්‍රජා පරිසරය. (2) දේශපාලන හා නෛතික පරිසරය.

(3) ගෝලීය පරිසරය. (4) විද්‍යාත්මක හා තාක්‍ෂණ පරිසරය.

සියලුම හිමිකම් ඇවිරිණි.
All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# දෙවන වාර පරීක්ෂණය 2018
## 10 ශ්‍රේණිය ව්‍යවසායකත්ව අධ්‍යයනය - II කාලය පැය 02 යි.

| නම/ විභාග අංකයඃ |
|---|

- පළමු ප්‍රශ්නය ඇතුලුව ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.
- පළමු ප්‍රශ්නයට ලකුණු 20 යි. තෝරා ගන්නා අනෙක් ප්‍රශ්නයකට ලකුණු 10 බැගින් හිමි වේ.

---

(01) නිර්මාණශීලී පුද්ගලයෙක් වූ ජයලලිත් කුඩා කාලයේ පටන් ම තමාගේම ව්‍යාපාරයක් ඇරඹීමේ අදහසින් පසු වූ තරුණයෙකි. ඔහු විසින් ප්‍රදේශයෙන් පහසුවෙන් සොයාගත හැකි කොහු භාවිතයෙන් විවිධ වර්ගයේ බුරුසු නිපදවීමේ ව්‍යාපාරයක් ආරම්භ කර පවත්වාගෙන යයි. ඒ සඳහා තම ගොඩනැගිල්ලක්ද තමා විසින් සකසා ගත් මැෂින් කිහිපයක් ද භාවිතා කරන අතර පුහුණු හා නුපුහුණු සේවකයින් 05 දෙනෙක් ද ඔහු යටතේ සේවයේ යෙදී සිටී. සියලු පරිපාලන කටයුතු, උපකරණ මිලදී ගැනීම් හා තීරණ ගැනීම් ජයලලිත් විසින් සිදු කරයි.

රජයේ බැංකුවකින් අඩු පොලියට ලබාදුන් ණය මුදලකින් ව්‍යාපාරය පුළුල් කළ අතර තම බිරිඳගේ සහය ද ඔහුගේ ව්‍යාපාර කටයුතුවලට නොම ද ව ලැබේ. ඔහුගේ නිෂ්පාදන අලෙවි වන්නේ තමා ජීවත්වන ප්‍රදේශයේ පමණක් වන අතර නවීන තාක්ෂණය භාවිතයට ගැනීම අවම ය. නමුත් ඔහු විසින් තම ශක්තිය පිළිබඳව විශ්වාස කරන අතර රටේ බුරුසු නිපදවන්නන් අතර ප්‍රමුඛස්ථානය හිමිකර ගැනීමේ සිහිනය ද ඔහු සතුව පවතී.

ඉහත සඳහන් සිද්ධිය ඇසුරින් (i) සිට (x) දක්වා ප්‍රශ්න සඳහා පිළිතුරු සපයන්න.

I. ඉහත සිද්ධියේ ඇතුලත් ව්‍යවසායකත්ව ගුණාංග 04 ක් ලියන්න

ii. භූමිය, ශ්‍රමය, ප්‍රාග්ධනය හා ව්‍යවසායකත්වයට අදාල සාධක 1 බැගින් ලියන්න.

iii. ජයලලිත්ගේ නිෂ්පාදිතය කුමක් ද?

iv. ජයලලිත් කුමන වර්ගයේ ව්‍යවසායකයෙක් ද? හේතුව සඳහන් කරන්න.

v. මෙම ව්‍යාපාරයෙන් ජයලලිත්ට හිමිවන ප්‍රතිලාභ 02 ක් ලියන්න.

vi. මෙම ව්‍යාපාරයෙන් ආර්ථිකයට හිමිවන ප්‍රතිලාභ 02 ක් ලියන්න

vii. මෙම ව්‍යාපාරය තුළ දැකිය හැකි ශක්තීන් 02 ක් ලියන්න..

viii. මෙම ව්‍යාපාරය තුළ පවතින සීමා 02 ක් ලියන්න.

ix. ජයලලිත් විසින් නියැලෙන ව්‍යවසායක භූමිකාවක් හා එම භූමිකාව තුළ ඔහු ඉටු කරන කාර්යයක් ලියන්න.

x. මෙම ව්‍යාපාරයේ අභ්‍යන්තර පරිසර සාධක 02 ක් හා බාහිර පරිසර සාධත 02 ක් සඳහන් කරන්න

(ලකුණු 02 × 10 = 20)

(02) I. නිර්මාණශීලීත්වයට බාධාකාරී වන සාධක 04 ක් සඳහන් කරන්න.

ii. ව්‍යවසායකයෙකුගේ නිර්මාණශීලීත්වය වර්ධනය කර ගැනීමට ගත හැකි ක්‍රියාමාර්ග 04 ක් සඳහන් කරන්න.

iii. නවෝත්පාදනය සිදුවන ආකාරයක් වන දිගුවක් සඳහා උදාහරණ 02 ක් සපයන්න.

iv. ''නිවෙස්වලට ගොස් ලෙඩරෝග සුව කිරීම'' සඳහා අදාල වන නවෝත්පාදනය සඳහා පදනම් වන මූලාශ්‍රය සඳහන් කරන්න .

v. නම්‍යශීලීත්වය යන්න කෙටියෙන් පහදන්න.

(ලකුණු 02 × 05 = 10)

(03) I. නිර්මාණශීලීත්වය හා නවෝත්පාදනය අතර සම්බන්ධතාව කෙටියෙන් පැහැදිලි කරන්න.

ii. අවශ්‍යතා හා වුවමනා අතර වෙනස්කම් 02 ක් සඳහන් කරන්න.

iii. ව්‍යාපාරවල ගති ලක්ෂණ 04 ක් නම් කරන්න.

iv. ව්‍යවසායකයා හා ව්‍යාපාරිකයා යන දෙදෙනා විසින්ම ඉටු කරනු ලබන කාර්යයන් 04 ක් සඳහන් කරන්න.

v. ව්‍යාපාරිකයා හා ව්‍යවසායකයා අතර පවතින වෙනස්කම් 02 ක් සඳහන් කරන්න.

(ලකුණු 02 × 05 = 10)

(04) I. ව්‍යාපාර ව්‍යවසායකයෙක් යනු කවරෙක් දැයි කෙටියෙන් පහදන්න.

ii. ආයතනික ව්‍යවසායකයින් සඳහා උදාහරණ 02 ක් සපයන්න.

iii. ව්‍යවසායකත්වය තුළින් ඇතිවන සමාජයීය ප්‍රතිලාභ 04 ක් සඳහන් කරන්න.

iv. භාණ්ඩ හා සේවා අතර වෙනස්කම් 02 ක් සඳහන් කරන්න.

v. කුඩා පරිමාණ ව්‍යාපාරවල දැකිය හැකි ගති ලක්ෂණ 04 ක් සඳහන් කරන්න.

(ලකුණු 02 × 05 = 10)

(05) i. දේශීය ආර්ථික සංවර්ධනය සඳහා කුඩා පරිමාණ ව්‍යාපාරවලින් සැපයෙන දායකත්වයන් 04 ක් සඳහන් කරන්න.

ii. කුඩා පරිමාණ ව්‍යාපාර ආශ්‍රිතව දැකිය හැකි ශක්තීන් 04 ක් සඳහන් කරන්න.

iii. බොහෝමයක් කුඩා ව්‍යාපාර ආරම්භ කර ටික කලකින් අසාර්ථකත්වයට පත්වේ. මෙසේ අසාර්ථකවීමට බලපෑ හැකි හේතු 04 ක් සඳහන් කරන්න.

iv. ව්‍යවසායකත්ව කාර්යයේ නිරතවීමේ දී ව්‍යවසායකයෙකුට විවිධ භූමිකාවල කටයුතු කිරීමට සිදුවේ. මෙසේ කටයුතු කිරීමට සිදුවන භූමිකා 02 ක් නම් කරන්න.

v. අතීත ව්‍යාපාර පරිසරයට වඩා නූතන ව්‍යාපාර පරිසරයේ දැකිය හැකි වෙනස්කම් 04 ක් සඳහන් කරන්න.

(ලකුණු 02 × 05 = 10)

(06) i. ව්‍යාපාර පරිසරය යන්න කෙටියෙන් පැහැදිලි කරන්න.

ii. ව්‍යාපාරයක බාහිර පරිසරය සාධක 04 ක් නම් කරන්න.

iii. ව්‍යාපාරයක ආසන්න පරිසර බලවේග 04ක් සඳහන් කරන්න.

iv. ශ්‍රී ලංකා ආර්ථිකයේ පවතින ප්‍රධාන ව්‍යාපාර අංශයක් වන ද්විතීයික අංශයට අයත් කොටස් 02 නම් කරන්න.

v. ශ්‍රී ලංකාවේ සුලභ සම්පත් අතරින් මානව නොවන සම්පත් 04 ක් සඳහන් කරන්න.

(ලකුණු 02 × 05 = 10)

(07) i. ව්‍යාපාර පරිසරය වර්ග කිරීම ගැලීම් සටහනකින් දක්වන්න.

ii. ව්‍යාපාර පරිසරයේ සිදුවී ඇති නව ප්‍රවණතා 04 ක් සඳහන් කරන්න.

iii. ව්‍යාපාර පරිසර ප්‍රවණතා පිළිබඳ සැලකිලිමත් වීමෙන් අත්වන ප්‍රයෝජන 04 ක් සඳහන් කරන්න.

iv. ගෝලීය පරිසරය යන්න කෙටියෙන් පැහැදිලි කරන්න.

v. ''මම අසාර්ථක නොවුවෙමි. නමුත් විදුලි බුබුල ක්‍රියාවිරහිත වියහැකි අවස්ථා නවසීය අනූනවයක් හඳුනා ගත්තෙමි.'' මෙම ප්‍රකාශය ඉදිරිපත් කළ ''තෝමස් අල්වා එඩිසන්'' තුළ පිළිඹිබුවන ව්‍යවසායකත්ව ගුණාංගය සඳහන් කරන්න.

(ලකුණු 02 × 05 = 10)

## පිළිතුරු පත්‍රය - I කොටස

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| 1 -(4) | 2 -(4) | 3 -(1) | 4 -(2) | 5 -(3) | 6 -(3) | 7 -(4) | 8 -(2) | 9 -(3) | 10 -(3) |
| 11-(3) | 12 -(1) | 13 -(2) | 14 -(1) | 15 -(3) | 16 -(1) | 17 -(1) | 18 -(2) | 19 -(3) | 20 -(4) |
| 21-(2) | 22 -(3) | 23 -(1) | 24 -(1) | 25 -(1) | 26 -(3) | 27 -(2) | 28 -(2) | 29 -(1) | 30 -(3) |
| 31-(1) | 32 -(2) | 33 -(2) | 34 -(2) | 35 -(4) | 36 -(3) | 37 -(4) | 38 -(2) | 39 -(1) | 40 -(2) |

(නිවැරදි පිළිතුරට ලකුණු 01 බැගින්)

## II කොටස

(01) I. නිර්මාණශීලීත්වය, අනාගත දැක්ම, සුභවාදී වීම, නවෝත්පාදනය, අසීරු අරමුණු ඉටුකරගැනීම කෙරෙහි ඇති නැඹුරුව. (ල.02)

ii. ● භූමිය - පොල් කොහු, ශ්‍රමය - පුහුණු, නුපුහුණු සේවකයින්. ප්‍රාග්ධනය - මැෂින්, ව්‍යවසායකත්වය - පරිපාලන කටයුතු තීරණ ගැනීම්. (කරුණු 02 ක් නම් කිරීමට ල.02)

iii. කොහු භාවිතයෙන් බුරුසු නිපදවීම (ල.02)

iv. ව්‍යාපාර ව්‍යවසායකයෙක්, ලාභ අපේක්ෂාවෙන් ව්‍යාපාර කටයුතුවල නිරතවීම. (එක් කරුණකට ල.01 බැගින් ල.02)

v. ● ආකර්ශනීය ලාභයක් ඉපයීම. ● ස්වයං පෝශිත බව ● ස්වකීය දෛවය තමා මතම රඳා පැවතීම. ● නිදහස හා ඉහළ තෘප්තිය. (කරුණු 02 ල.02 බැගින් ල.02)

vi. ● දේශීය සම්පත් උපයෝජනය කිරීම, ● ප්‍රාදේශීය සංවර්ධනය, ● රැකියා අවස්ථා ජනනය, ● රටේ සමස්ත නිෂ්පාදන ඉහළ යාම. (කරුණු 02 ල.02 බැගින් ල.02)

vii. ● රජයෙන් ලැබෙන අඩුපොලී සහිත ණය. ● බිරිඳගේ සහයෝගය ලැබීම. (කරුණු 02 ල.02 බැගින් ල.02)

viii. ● වෙළඳපොල සීමා වීම ● නවීන තාක්ෂණය භාවිත නොවීම. (කරුණු 02 ල.02 බැගින් ල.02)

ix. ● අයිතිකරුගේ භූමිකාව, උදා: අවශ්‍ය උපකරණ මිලදී ගැනීම.. (කරුණු 01 ල.01 බැගින් ල.02)

x. ● අභ්‍යන්තර - අයිතිකරුවන්, සේවකයින් ● බාහිර - ස්වභාවික පරිසරය, තාක්ෂණික පරිසරය (ල.02) (ලකුණු 2×10=20)

(02) i. ● විශ්වාස හා ආකල්ප කෙරෙහි තදබල ලෙස ගැලී සිටීම, ● යම් ගැටලුවකට එකම විසඳුමක් පමණක් ඇතැයි සිතීම. ● ක්ෂණික ප්‍රතිඵල අපේක්ෂා කිරීම. ● ප්‍රායෝගික වීමට බාධා ඇතැයි සිතීම. ● වැරදි හා විවේචන සඳහා ඇති බිය.

ii. ● විවිධත්වය ග්‍රහණය කර ගැනීම. ● අසාර්ථකත්වය ඉවසීම. ● කුතුහලය දිරිමත් කිරීම. ● ගැටලු අභියෝග ලෙස දැකීම. ● නිර්මාණශීලීත්වය අගය කිරීම.

iii. ● ගැලපෙන පිළිතුරට ලකුණු පිරිනමන්න.

iv. වෙළෙඳපොළේ වෙනස්වීම.

v. ගැටලු හා අවස්ථා දෙස බලා ඒවාට විසඳුම් ලෙස නව අදහස් සංවර්ධනය කිරීමට හෝ නව මාර්ග සොයා ගැනීමට ඇති හැකියාවයි. (ලකුණු 02 x 5 = 10)

(03) I. නවෝත්පාදනයේ ආරම්භය නිර්මාණශීලී අදහසකි. මේ අනුව නිර්මාණ ශීලී අදහස් ප්‍රයෝජනවත් දෙයකට පරිවර්තනය කිරීම නවෝත්පාදනය මගින් සිදු වේ.

ii.

| අවශ්‍යතා | වුවමනා |
|---|---|
| ● මූලිකව පැන නගියි. | ● ද්විතීකව පැන නගියි. |
| ● සීමිතය. | ● අසීමිතය. |
| ● පොදුය. | ● පෞද්ගලික වේ. |

iii. ● ව්‍යාපාරයේ සම්පත් ගනුදෙනුවල යෙදවීම ● ගනුදෙනු අඛණ්ඩව සිදු වීම. ● අරමුණක් පැවතීම. ● අවදානමක් පැවතීම. ● මිල මත ගනුදෙනු සිදුවීම. ● ආර්ථික කටයුත්තක් වීම.

iv ● අවදානමකට මුහුණ දීම ● ගනුදෙනුවල නිරත වීම. ● සම්පත් භාවිත වීම. ● ආර්ථික කටයුත්තක යෙදීම. ● තරගයට මුහුණ දීම.

v

| ව්‍යාපාරිකයා | ව්‍යවසායකයා |
|---|---|
| ● ව්‍යාපාර කටයුතුවල යෙදෙන්නේ ගතානුගතිකව සම්ප්‍රදායික ක්‍රමයට. | ● පාරිසරික වෙනස්කම් වලට ප්‍රතිචාර දක්වමින් තාක්ෂණික ක්‍රම ඔස්සේ ව්‍යාපාර කටයුතු කරයි. |
| ● අවදානම් භාර ගැනීමට එතරම් කැමැත්තක් නොදක්වයි. | ● අවදානම් හොඳින් තක්සේරු කර දැරිය හැකි අවදානම් පමණක් භාර ගනියි. |
| ● තරගයට මුහුණදීමට කැමැත්තක් නොදක්වයි. | ● තරගය කැමැත්තෙන්ම සොයා යයි. |

(ලකුණු 02 x 5 = 20)

(04) i. සාමාන්‍යයෙන් ලාභ අපේක්ෂාවෙන් ව්‍යාපාර කටයුතුවල නිරත වන ව්‍යවසායකයෝ ව්‍යාපාර ව්‍යවසායකයෝය.

ii. ගැලපෙන පිළිතුරුවලට ලකුණු පිරිනමන්න.

iii. ● රැකියා අවස්ථා ජනිත වීම ● ජනතාවගේ ජීවන තත්වය උසස් වීම ● සමාජ සුභසාධන කටයුතු දියුණු වීම. ● ජනතාවගේ නුගත්කම් සඳහා විසඳුම් ලැබීම. (ගැලපෙන පිළිතුරු සඳහා ලකුණු පිරිනමන්න)

iv.

| භාණ්ඩ | සේවා |
|---|---|
| ● ස්පෘශ්‍ය වේ | ● අස්පෘශ්‍ය වේ |
| ● ගබඩා කළ හැකිය | ● ගබඩා කල නොහැක. |
| ● සපයන්නාගෙන් වෙන් කළ හැකි. . | ● සපයන්නාගෙන් වෙන් කළ නොහැක |

v. ● කුඩා ප්‍රාග්ධනයක් යොදවා තිබීම. අඩු ● සේවක සංඛ්‍යාවක් සිටීම. ● ව්‍යාපාරය තනි අයිතිකරුවෙකු සතුවීම. ● තීරණ ගැනීම පහසු වීම. ● ව්‍යාපාර කටයුතු කුඩා ප්‍රදේශයකට සීමා වීම.

(05) I. ● රැකියා අවස්ථා උත්පාදනය කිරීම. ● ආදායම් බෙදීයාමේ විෂමතාවය අවම වීම. ● ජනතාවගේ ජීවන තත්වය උසස් වීම. ● දේශීය සම්පත් භාවිතයට ගැනීම.

ii. ● සීමිත සම්පත් ප්‍රමාණයකින් වුවද ආරම්භ කළ හැකි වීම. ● පවත්නා දේශීය සම්පත් භාවිතයට ගත හැකි වීම. ● ගතික පරිසරය ක්ෂණිකව ප්‍රතිචාර දැක්විය හැකි වීම. ● රජයෙන් විශේෂ දිරිගැන්වීම් ලැබීම.

iii. ● මූල්‍ය කටයුතු පාලනය දුර්වල වීම. ● තරගකාරීත්වයට මුහුණ දීමට අපහසු වීම. ● දුර්වල සම්බන්ධතා. ● සැලසුමකින් තොරව ව්‍යාපාර කටයුතු සිදු කිරීම. ● පළපුරුද්ද ප්‍රමාණවත් නොවීම.

iv. ● අයිතිකරුගේ භූමිකාව. ● කළමණාකරුගේ භූමිකාව. ● නායකයාගේ භූමිකාව.

v. ● තරගකාරීත්වය වැඩි වීම. ● පාරිභෝගිකයා බලවත් වීම. ● අවශ්‍යතා මත පැනනගින වුවමනා සංකීර්ණ වීම. ● ගෝලීය වශයෙන් ව්‍යාප්ත වීම. ● භාණ්ඩ හා සේවා සුලභ වීම. (ලකුණු 02 x 5 = 20)

(06) i. ව්‍යාපාර වල ක්‍රියාකාරීත්වයට ව්‍යාපාර අභ්‍යන්තරයෙන් මෙන්ම බාහිරව ධනාත්මකව හා ඍණාත්මකව බලපෑම් ඇති කරන සාධක හා බලවේග සියල්ල ව්‍යාපාර පරිසරය ලෙස හැඳින් වේ. ii. ● ආසන්න පරිසරය. ● ප්‍රජා පරිසරය. ● ආර්ථික පරිසරය. ● තාක්ෂණික පරිසරය. ● ස්වභාවික පරිසරය. ● ගෝලීය පරිසරය. iii. ● ගණුදෙනුකරුවන්. සැපයුම්කරුවන්. ● තරගකරුවන්. ● සමාන නිෂ්පාදන සපයන්නන්. ● අනාගත ආයෝජකයින්. iv. ● නිමැවුම්. ● ඉදිකිරීම්. v. ස්වභාවික සම්පත්. ● ඛනිජ සම්පත්. ● සංස්කෘතික සම්පත්. ● සත්ව සම්පත්. (ලකුණු 02 x 5 = 10)

(07) I. ජනගහන වර්ධන වේගය, ජන සංයුතිය, වයස් ව්‍යුහය (කරුණකට 01 බැගින් ල.02) ii. ගනුදෙනුකරුවන්, සැපයුම්කරුවන්, තරගකරුවන්, විභව ආයෝජකයන් (02 ක් නම් කිරීමට ල.02) iii. ප්‍රාථමික අංශය, ද්විතියික අංශය, තෘතියික අංශය (කරුණු 03 ට ල.02 යි කරුණු 02 ට ල.01) iv. නිවැරදි පිළිතුරු 02 ට ල.02 යි. v. සුදුසු පිළිතුරු 02 ට ලකුණු 02 යි.

(07) i.

ව්‍යාපාර පරිසරය
- අභ්‍යන්තර පරිසරය
- බාහිර පරිසරය

ii. ● නව තාක්ෂණික ක්‍රම සහ උපකරණ භාවිතය. ● පරිසර හිතකාමී නිෂ්පාදන සඳහා නැඹුරු වීම. ● සෞඛ්‍ය ආරක්ෂිත ආහාර සඳහා යොමුවීම. ● සැකසූ ආහාර සඳහා ඉල්ලුම ඉහල යාම. ● නැනෝ තාක්ෂණය ඇසුරින් ව්‍යාපාර බිහිවීම. ● පරිසර හිතකාමී බලශක්ති අරගලය.

iii. ●සාර්ථක ව්‍යාපාරික අවස්ථා ග්‍රහණය කර ගැනීමට හැකි වීම. ● පාරිසරික ගැටලු අවම කර ගැනීමට හැකි වීම. ● මෙතෙක් ප්‍රයෝජනයට නොගත් සම්පත් භාවිතයට ගත හැකි වීම. ● වොළඳපොළ තරගකාරීත්වයට සාර්ථකව මුහුණ දීමට හැකිවීම. ● නව ආදායම් මාර්ග ජනිත කර ගැනීමට හැකි වීම.

iv. ලොවපුරා රටවල් දේශ සීමාවකින් තොර ව බද්ධ වී කටයුතු කිරීමේ ප්‍රවණතාව ගෝලීය පරිසරයයි.

v. අසීරු අරමුණ ඉටු කර ගැනීම කෙරෙහි ඇති නැඹුරුව .

(ලකුණු 02 x 5 = 10)